නිලධාරී කර්නල් රිස්වි මිඩින් එහි ලුතිනන් කර්නල් නිසාම් මුතාලිෆ් අමු අමුවේ කොටි පිස්තෝල කල්ලිය මරා දැමූ අවස්ථාවේ මේ උදවිය කළේ කුමක් ද! කිසිම දෙයක් නැත.

කොටි මන්නාරමේදී නාවික හමුදා භටයන් 17 දෙනෙක් මරා දැමූ අවස්ථාවේ මේ අය කළේ කුමක්ද! කොටි ත්‍රිකුණාමලයේදී බෝට්ටුවකට පහරදී නාවික භටයන් 13 ක් මරා දැමූ වේලාවේ මේ අයට එය පෙනුනේ නැද්ද! කොටි සෙවිටිකුලමේදී නාවික භටයන් 09 දෙනෙක් ඝාතනය කළ අවස්ථාවේ මේ විරෝධතාකරුවන් සිටියේ කොහේද?

පාර්ලිමේන්තුවේ විරෝධතා ව්‍යාපාර දියත් කරන දෙමළ මන්ත්‍රීවරුන් ඒවා ඉදිරියේ නිහඬව සිටියේ ඇයි.? කොළඹ මෙහෙයුම් නතර කරන ලෙස බල කරන එන්.ජී.ඕ. මහන්වරුන් ඒවා සිදුවනවිට නිදිද!

කොටි ප්‍රචණ්ඩ ක්‍රියා කරන කොට ඇස්කන් පියා ගෙන සිටීමටත්, ආණ්ඩුවේ ආරක්ෂක අංශ වලින් යම් ප්‍රශ්නයක් වුවහොත් ගිරිය පුප්පා ගෙන කෑමොර දීමටත් මේ එන්.ජී.ඕ හා දෙමළ මන්ත්‍රී නඩය නම්‍යශීලී වුණේ කෙසේද! යන්න පුදුම සහගතය.

ඔවුන්ගේ ජනතාවාදී ප්‍රජාතන්ත්‍රවාදී ගති ලක්ෂණ ඉදිරියට දමා ගෙන කරන ත්‍රස්තවාදී වියරුව මෙයින්ම ඕනෑම කෙනෙකුට වැටහෙනවා ඇත. මෙයට අපි තවදුරටත් ඉඩදිය යුතුද! යන්න උගත් බුද්ධිමත් ප්‍රාග්ගිශීලී ජනතාව කල්පනා කර බලා ප්‍රායෝගිකව ක්‍රියාත්මකවීම ඉතා වැදගත්ය. එසේ නොවුණහොත්, ඉන් ඉදිරියේදී භයානක ප්‍රතිඵලවලට අපට මුහුණ පෑමට සිදුවනු ඇත.

- ශ්‍රී ලාල් ප්‍රියන්ත

යමක වග්ග 7 සහ 8

සුභානුපස්සිං විහරන්තං
ඉන්ද්‍රියේසු අසංවුතං
භෝජනම්හි ච අමත්තන්නං
කුසීත නවීරියං
තං වේ පසහති මාරෝ
වාතෝ රුක්ඛංව දුබ්බලං

රූපාදිය සුභයයි සිතන - අසංවර ඉඳුරන් ඇති
(රූප,ශබ්ද,ගන්ධ,රස,පහස) (ඇස,කණ,නාසය, දිව, කය, හිත් නොමැති)
භෝජනයෙහි පමණ නොදන්නා- අලසව වීරය පිරිහුණු
නිසි ලෙස නැති යමක් වේද- මරුට මැඩලිය හැකිය
වාතය දුබල රුක්කක්- ඊදුරා බිම හෙලන්නාක් මෙන්

Subhanupassim viharantam
indriyesu asamvutam
Bhojanamhi amattannum
kusitam hinaviriyam
Tam ve pasahati maro
vato rukkham va dubbalam

Whoever lives contemplating pleasant things, with senses unrestrained, in food immoderate,indolent, inactive,him verily mara over throws, as the wind a weak tree.

අසුභානුපස්සිං විහරන්තං
ඉන්ද්‍රියේසු සුසංවුතං
භෝජනම්හි ච මත්තන්නං
සද්ධ ං ආරද්ධවීරියං
තං වේ තප්පසහති මාරෝ
වාතෝ සේලංව පබ්බතං

රූපාදියෙහි අසුභයයි සිතන- සංවර ඉඳුරන් ඇති
භෝජනයෙහි පමණ දන්න- සැදැහැති වීරයෙන් පිරුණු
නිසි ලෙස ඇති යමක් වේද- මරුට මැඩලිය නොහැකිය
ගල්කුලක් සුළඟින් සොලවනු නොහැකි විලසින්

Asubhanupassim viharantam
indriyesu susamvutam
Bhojanamhi ca mattannum
saddham araddhaviriyam
Tam ve nappasahati maro
vato selam'va pabbatam

whoever lives contemplating 'the impurities' with senses restrained, in food moderate, full of faith, full of sustained energy, him mara over throws not, as the wind a rocky mountain.

චුල්ලකාල- මහාකාල තෙරහු ඇරබ.

සෙනවය නුවර බොහෝ ධනපති පවුලෙක් විය. ඒ පවුලේ මහාකාල, මජ්ජිමකාල, චුල්ලකාල යයි වෙළඳාමේ යෙදෙමින් "විකාව ගෙවන සහෝදරයන් තිදෙනෙක් වෙසෙති. චුල්ලකාලයෙනට බිරින්දෑවරු දෙදෙනෙකි. මජ්"මකාලට සිව්දෙනෙකි. මහාකාලයනට අටදෙනෙකි. මහාකාල වෙළඳාණෝ බොහෝ බිරිඳුන් ඇසුරු කොට විසුවත් වරදට රිසි නොවෙති. පාපකර්මයන් සඳහා බියවෙති. පසු කලකදී චුල්ලකාලයන් හා එක්ව වෙළඳාම පිළිබඳ සැවැත් නුවරට පැමිණ එහිදී බණ දහම අසා පැහැද සොයුරන්ගෙන් අවසරය ගෙන බුදු සසුනේ පැවිදිව රහත්පල ලැබ නිවන් පසක් කළිහ.

වෙළඳාමේ දක්ෂයෙක් වූ දෙවු සොයුරාගේ පැවිදිවීම තමන්ගේ පවුලට හා වෙළඳාමට සිදුවූ ලොකු පාවක් යයි සිතා චුල්ලකාලයෝද මම සහෝදරයා රැගෙනම සිවුරු හැර එමියි යන නරක චින්තනාවකින් සසුනේ පැවිදි වූහ. චුල්ලකාලයෝ පැවිදි වුවත් සිත පිරිසිදු නැත. හේ නිතරම ගේ දොර හා වෙළඳාම ගැන සිතමින් වෙසේ. බිරිඳුන්ගේ අවයව ගැන මෙනෙහි කරමින් කම රස විඳි සැටි සිතයි. ඔවුන් පරපුරුෂයන් ඇසුරු කරද්දැයි සිතයි.

එකල සෙනවය නුවරැන්ගේ ආරාධනයෙන් බුදු හිමියන් සහ පන්සීයක් පිරිස සමග නුවර අවට ඇටවිරියා වනයකට වැ" සේක. මහාකාල සහ චුල්ලකාල යන පැවිදි දෙනමද ඒ පිරිස අතර වෙති. අපේ සැමියෝ අප නුවරට ආහයි මේ දෙදෙනාගේ බිරිඳෑවරු දැනගත්තාහ. චුල්ලකාලයන්ගේ බිරින්දෑවරු පැවිදි වූ තම සැමියා කෙසේ හෝ නිවසට ගෙන්වා ගෙන සිවුරු ගලවා රෙදි හන්දවා පැවිද්දෙන් මුදවා ගත්හ. ඒ ක්‍රමයෙන්ම මහාකාලවත් ගෙන්වා ගෙන සිවුරු අරවා ගනිමුයි කතිකා කරගත් මහාකාලයන්ගේ බිරින්දෑවරු බුදු හිමියන් හමුවී දානයකට ආරාධනා කළිහ. දන් පිළිගන්වා අවසානයේදී බණ දහම දෙසීම සඳහා මහාකාලයන්ගේ බිරින්දෑවරු මහාකාල හිමියන් නවතා යන ලෙස බුදු හිමියන්ගෙන් ඉල්ලා සිටියහ. ඒ අනුව මහාකාල හිමියන් නිවසේ නවතා බුදු හිමියන් ඇතුළු පිරිස ආපසු වැ"යහ. අපේ සැමියාද "අපි ගනිමුයි" සිතා මහාකාල තෙරුන්ගේ සිවුරු හැර ගැනීමට අටදනා වටකොට ගත්හ. මහාකාල තෙරුන් වහන්සේ රහතන් වහන්සේ කෙනෙකි. තෙරුන් වහන්සේගේ ඇඟට අත තැබීමටවත් නොහැකි විය. සෘද්ධියෙන් වහාම ඉවතට වැ"යහ. මුලාවූ ගැහැණු විලියෙන් මිරිකී ගියහ. බුදු හිමි ඒ නිමිති කොට දුබලයන් කෙලෙස් මරු වශඟවී පිරිහෙන බව හා බලැතියන් කෙලෙස් මරු පරදවන බවත් පෙන්වා වදාළිහ.

25 පිටෙන්

රොව ආදී වශයෙනි ඒ. කඩ, කූඩ, කූඩ, කෝඩ වැනි දෙමළ වචන වුවද වරනැගෙන්නේ ඒ අනුව ය. එපමණක නොව කමීස, ලේන්සු, පෝරක, වීදුරු ආදී පුර්තුගීසි වචනත්, කරාබු ඔර්ලෝසු කන්තෝරු කේතල ආදී ලන්දේසි වචනත්, ගව්මි, පව්මි, ලාම්පු, දුසිම් ආදී ඉංගිරීසි වචනත් වරනැගෙන්නෝ ඒ අනුවමය. අපේ පැරණියන් (පැරැන්නන්) කවර භාෂාවක වචනයක් වුවත් වහරට ගත්තේ ඒ වචනයට සිංල මුහුණුවරක් දීමෙන් අනතුරුවය.
පෙන් - පෑන්, යාඩ් - යාර, ක්වෝට් - කාර්තු, පෙනි පෙන්ස් - පැන්ස, භාණ්ඩුඩ්වෙය්ට් - භොණ්ඩර ආදි ඉංගිරීසි වචන එබඳු ඒවාය. ඒ වචන ව්‍යවහාර කරන විට කිසිඳු ගැටලුවක් ඇති නොවේ.
මේ ක්‍රමය අද වෙනස් ලෙස සමහරු භාවිතා කරති. ඉංගිරීසි වචනයට සිංහල මුහුණුවරක් දීම නූගත් කමේ ලකුණක් හැටියටත් ඒ වචන ඒ හැටියට ම ගැනීම උගත්කමේ ලකුණක් හැටියටත් සලකන පිරිසක් අද සිටිති.

බෝය් කෙනෙක්, ගල්ස්ලා, සෝං එකක්, බොටිල් එකක් යන ව්‍යවහාරය ඔබ අසා ඇතැය් සිතමි. ඒ සිංහල ද ? සිංගිරිසි ද? බොරු (බුරු) සිංහල ද? ගැලපෙන නමක් තෝරා ගැන්ම ඔබට බාර ය. දැනු අපි කාරය බසය ලොරිය, වැසිය ආදී වචන විමසමු. පව්මි ගව්මි ආදි සමහර හලස්ත වචනත් ලොරි, කොරි, ජැටි, ආදි ස්වරාන්ත වචනත් අපේ බසේ පහසුවෙන් භාවිතා වේ. ඒවා ඉහත දැක් වූ විභක්ති ප්‍රත්‍ය සමඟ හොඳින් සම්බන්ධ වේ. එහෙත්,

බස්ද අ = බස ලෙසත් බසද අ = බසය ලෙසත් ය වරනැඟිය යුත්තේ. බස්, කස යන වචන වර නැගෙන ආකාරය අනුවය. ඒ ඒනිසා

1. 'බස්' ශබ්දය බසද බස්, බසට - බස්වලට, බසෙන් - බස්වලින්, බසේ - බස්වල යනුවෙන් වර නැගෙන අතර
2. 'බස' ශබ්දය බසය - බස්වල, බසයට - බස්වලට, බසයෙන් - බස්වලින්, බසයේ - බස්වල යනුවෙනි වරනැගෙන්නේ.

මේ දෙවැනි ක්‍රමය භාවිතා වන්නේ 'බස' ශබ්දය අනුවය. කස පහර, වස බඳුන, රස කැවිලි යන විදිය ම 'බස නැවතුම' වහර විය යුතුය. එහෙත් බස නැවතුම, බස පළ, බස ගාල (ගාල යනු ගවහලය්) යන ව්‍යවහාරය හුරු කිරීම දුෂ්කර ය. මෙයට පිළියමක් අවශ්‍යය. ඒ සඳහා අය - ෆ , අයට - ෆවලට, අයෙත් - ෆ වලින් , අයේ - ෆ වල යන විභක්ති හඳුන්වා දිය යුතු ද? එ සේ වුව හොත් නම්,

බස් (බස්ද අය) බසය - බස් (බස්ද අයට) බසයට - බස්වලට, (බස්ද අයෙත්) බසයෙන් - බස්වලින් (බස්ද අයේ) බසයේ - බස්වල යන ව්‍යවහාරය නිවැරදි ලෙස පිළිගත හැකිය.

සන්නස
අන්තර්ජාලයෙන් ලොව වටා
www.sannasa.net
දැන් **Sinhalajukebox.org** අනුග්‍රහයෙන්
සන්නස පසුගිය කලාප ද අන්තර්ජාලයෙන් කියවන්න